# 8 ශුද්ධාත්ම බලය අත්දුටු මුල් සභාව

ක්‍රියා 4 : 5-22

මිනිස් වර්ගයාගේ විමුක්තිය උදෙසා වූ ජේසුස් වහන්සේගේ මෙහෙවර උන්වහන්සේගේ නැවත පැමිණීම දක්වා පවත්වාගෙන යෑම කිතුනු අපගේ වගකීම වේ. උන්වහන්සේගේ මෙහෙවර උදෙසා අප කැපවන කළ, ඒ සඳහා අවැසි මගපෙන්වීම - බලය - ශක්තිය අපවෙත හිමිකර දෙන බවට ජේසුස් වහන්සේ පොරොන්දු වූ සේක. ඒ උදෙසා **ජේසුස් වහන්සේ අප කෙරෙහි ක්‍රියා කරනුයේ ශුද්ධාත්මයාණන් වහන්සේ මගිනි.** ඒ බව මළවුන්ගෙන් උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ස්වර්ගාරෝහණවන අවස්ථාවේ දී ප්‍රේරිතයන් වෙත මෙලෙස ප්‍රකාශ කර සිටි සේක.

***"...... ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ වෙත පැමිණි කල ඔබ බලය ලබන්නහු ය. එවිට ඔබ ජෙරුසලමෙහි ද, මුළු ජුදයෙහි හා සමාරියෙහි ද, පොළොවේ සීමාන්තය දක්වා ද, මාගේ සාක්ෂිකාරයෝ වන්නහු ය"***

ජේසුස් වහන්සේ වදාළ පරිදි ම පෙන්තකොස්ත දිනයේ දී උන්වහන්සේ එකී ශුද්ධාත්ම බලය ඔවුන් වෙත ප්‍රදානය කළ සේක.

ශුද්ධාත්මදනය ලැබීම තුළ මහත් බලයක් ලද්දු වූ ප්‍රේරිතවරු ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳ ව සාක්ෂි දරමින් ද, බලවත් ලෙස දේශනා කරමින් ද, එහි ප්‍රතිඵල ලෙස මනස්ථාපනය වී සිත් හරවා ගනු ලබන්නවුන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තීස්ම - ස්නාපනය කරමින් ද, ලෙඩුන් සුවපත් කරමින් ද, දහස් ගණනින් සෙනග ස්වාමීන් වහන්සේ වෙතට හරවා ගත්හ.

ප්‍රේරිතයන් ශුද්ධාත්ම දානය ලද පසු කරන ලද පළමු බලවත් ක්‍රියාව වූයේ "සුදර්ශන" නම් ලත් දෙරටුව අසල දිනපතා සිඟමන් යදිමින් සිටි කොරවූ මිනිසා සුවපත් කරනු ලැබීම ය. එම සිද්ධිය ස්වාමීන් වහන්සේ මහිමයට පත්වන පිණිස ශුද්ධාත්ම බලය ප්‍රේරිතයන් මගින් ක්‍රියාත්මක වූ අවස්ථාවක් විය. මහත් සෙනගක් අභියස සිදු කරන ලද මෙම බලවත් ක්‍රියාව, ජේසුස් වහන්සේ කුරුසිපත් කළ හා තවදුරටත් උන්වහන්සේ වෙනුවෙන් පෙනී සිටි ප්‍රේරිතවරුන් වරදට පත්කරන්නට බලා සිටින්නවුන් හට ඉවසුම් නොදෙන කාරණයක් විය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.



8.1 රූපය - සුදර්ශන දෙරටුව ළඟ කොරවූ මිනිසාට සුවය ලැබීම

මෙලෙස, උත්ථාන වූ ජේසුස් වහන්සේගේ සාක්ෂිකාරයන් වීම හා ශුද්ධාත්ම බලය තුළ ඔවුන් සුබ අස්න ප්‍රකාශ කරන්නට එඩිතර ව ඉදිරිපත් වීම නිසා ප්‍රේරිතයන්ට විඳින්නට සිදුවන කටුක අත්දැකීම් ද, ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් තුළ ක්‍රියා කිරීම හේතුකොටගෙන ඔවුන් එම අවස්ථාවන්ට එඩිතර ව මුහුණ දෙන ආකාරය හා ඒ මගින් ස්වාමීන් වහන්සේ මහිමයට පත්කරනු ලබන ආකාරය ද විමසා බලමු.

**විමසා බලමු**
**ක්‍රියා 4 : 1 - 22**

ඉහත ඔබ විසින් විමසා බලන ලද බයිබලීය කොටසෙහි ක්‍රියා 4:10 සිට 20 දක්වා වූ පදවලින් අපගේ ජීවිතවලට ලද හැකි අත්දැකීම් පහත දක්වෙන වගුවෙහි වම් පසෙහි දක්වා ඇත. අදාළ බයිබලීය කොටස නැවත හොඳින් විමසා බලන්න. ඒ ඒ අත්දැකීමට වඩාත් ගැළපෙන බයිබල් පාඨය තෝරාගෙන ඊට ඉදිරියෙන් ලියන්න. (මෙම වගුව ඔබගේ අභ්‍යාස පොතෙහි සටහන් කරගෙන මෙම අභ්‍යාසයෙහි යෙදෙන්න)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

| ලද හැකි අත්දැකීම් | වඩාත් ගැළපෙන බයිබල පාඨ |
|---|---|
| ★ අපගේ ජීවිත ගැලවීම සලසා දෙන එක ම තැනත් වහන්සේ ජේසුස් වහන්සේ බව | ................................................ |
| ★ ලෞකික ජීවිතයේ කිසිදු වටිනාකමක් නොදැකිය හැකි පුද්ගලයන්, ජේසුස් වහන්සේ තුළ ජීවත් වන කල්හි මහත් වටිනාකමක් ලබන බව | ................................................ |
| ★ ජීවිතයේ සියලු කාරණාවල දී ප්‍රමුඛතාව හිමිකර දිය යුත්තේ ලෞකික දේවලට නොව දෙවියන් වහන්සේ වෙත බව | ................................................ |
| ★ ජේසුස් වහන්සේ අපගේ ජීවිතවලට පැමිණි කල, උන්වහන්සේ ගැන සාක්ෂි දරමින් මහිමයට පත් කිරීම නොකර සිටිය නොහැකි දෙයක් බවට පත්වන බව | ................................................ |
| ★ යමෙකු දෙවියන් වහන්සේගේ නාමය නිසා ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ද ඔහු උසස් කරනු ලබන බව | ................................................ |
| ★ උත්ථාන වූ ජේසුස් වහන්සේගේ අනුහසින් රෝගීන් සුවපත් වන බව | ................................................ |

එදා ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණ වන අවස්ථාවේ දී ප්‍රේරිතයන් වෙත පවරන ලද මෙහෙවර එනම් ***"පොළොවේ සීමාන්තය දක්වා මාගේ සාක්ෂිකාරයෝ වන්න"*** යන්න කිතුනු අප සැම දෙන වෙත ද පැවරෙන වගකීමක් වේ. එම උතුම් වූ වගකීම ඉටුකිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම මෙන් ම බලය ද උන්වහන්සේ අප වෙත ලබා දෙන සේක. ඒ උන්වහන් සේ පොරොන්දු වූ ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේ අප වෙත දනය කරනු ලැබීම මගින් වේ. එකී දේව මෙහෙවරට අප යොමුවන කල විවිධ කටුක අත්දැකීම්වලට ලක්වීමට අපට සිදුවනු ඇත. නමුත් එදා ප්‍රේරිතයන් හට ලබා දුන්නාක් මෙන් අප හට ද අවශ්‍ය බලයත් - ශක්තියත් - රැකවරණයත් - අවසානයේ ජයග්‍රහණයත් උන්වහන්සේ සලසා දෙන සේක.

**ක්‍රියාකාරකම**

1. ශුද්ධාත්මදනය ලැබීම තුළ එදා ප්‍රේරිතයින් විසින් සිදු කරන ලද බලවත් ක්‍රියා හඳුන්වා දෙන්න.
2. පේදුරු තුමා සහ ජොහාන් තුමා මන්ත්‍රණ ශාලාව ඉදිරියේ ක්‍රියාකළ ආකාරය මගින් අපගේ කිතුනු ජීවිතවලට ලද හැකි ආදර්ශ **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.